128851
KM
09.05.95

Rs. 250/-

# බුදු දහමෙහි එන අපාය සංකල්පය පිළිබඳ තුලනාත්මක විග්‍රහයක්

අංකය 10
29 JUN 1993
විභාග අංශය

මාබුල්ගොඩ සුමනරතන හිමි.

ලි.ප.අංක: ඒ 15350

29-6-1993

29/6/93
ජී. ආරියපාල පෙරේරා
අධ්‍යයනාංශ ප්‍රධානී
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
නුගේගොඩ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,

පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ

දර්ශනපූරි උපාධි පරීක්ෂණය සඳහා

ඉදිරිපත් කෙරෙන නිබන්ධය.

1993 ජුනි මස 29 දින.

128851

## උපකාරානුස්මෘති.

අද මා මේ තත්ත්වයට ගොඩ නැගීමට දැතට සවිය දුන් ආදරණීය මෑණියන් වූ, රොසලින්නෝනා ජයකොඩි, ආදරණීය පියාණන් වූ, ඒබ්‍රහම් රාජපක්ෂ, පැවිදි මගට, ගිහිගෙන් නික්මීමට ශික්ෂණය ලබා දුන් ආදරණීය මිත්තණිය වූ, ජේන්නෝනා කළුආරච්චි සහ පෙරමග පැමිණි ඇඩ්ලින් පෙරේරා මාතාව ද පළමුව සිහිකරමි.

සියු දරුවෙකු වෙත දැක්විය යුතු නිතැළැල් සෙනහස දක්වා, මා පැවිදි මග පහන් කළ, බ්‍රාහ්මණගම දූවේ පුරාණ විහාරය, හෝමාගම ශ්‍රී සුගතබිම්බාරාමය යන විහාරද්වයාධිපති සද්ධර්ම වාගීශ්වර අභිධම්මිකාචාර්ය කිරිගම්පමුණුවේ චන්ද්‍රානන්දාභිධාන හේවාගම් කොරළයේ ප්‍රධාන සංඝනායක ගුරුදේවමාහිමිපාණන්,

නියදගල විදුහල, දිපංගොඩ ශ්‍රී මේධානන්ද විදුහල, පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙණ, ගංගොඩවිල සුභද්‍රාරාමය යන මගේ ගුරු කුළ ගුමින්, සමගම සිප් නැණ අබියෙස් කළ ශ්‍රී ජයවර්ධනපුර (විද්‍යෝදය) සරසවි මව ද, අදරින් අනුස්මරණය කරමි.

මෙම කාර්යයෙහි දී, අදහස් හා උපදෙස් දුන්, අතිගරු ලබුගම ලඞ්කානන්දාභිධාන මහානායක මාහිමියාණන්, අතිගරු බලංගොඩ ආනන්ද මෛත්‍රෙය මහානායක මාහිමියාණන්, අතිගරු හගුරන්කෙත විමල අනුනායිමියාණන්, අතිගරු තිරුළපන යෝමානන්ද නායක මාහිමියාණන්, මහාචාර්ය බෙල්ලන්විල විමලරතන මාහිමිපාණන්, කථිකාචාර්ය දේවාලේගම මේධානන්ද මාහිමිපාණන්, කම්මට්ඨානාචාර්ය ගම්පහ ජේමසිරි මාහිමිපාණන්, මාචින්තර වජිරඤාණ මාහිමිපාණන් ආදි පූජ්‍ය උතුමන් ද, තැළම්ය, "නුළණ" පර්යේෂණ මධ්‍යස්ථානයේ, ආචාර්ය ඇලෝසියස් පීරිස් පියතම, මහරගම අරාබි විදුහලේ මවුලවි අල්හාජ් ඒ.එල්.එම්.රුහුල්හක් හිටපු අධ්‍යාපන නිලධාරිතුමා යන පූජ්‍ය උතුමන් ද,

පර්යේෂණ කෘතියෙහි උපදේශක කතතුරු දැරූ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශ ප්‍රධාන මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මැතිතුමන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය චන්දිම විජේබණ්ඩාර මැතිතුමන්, තත් අයුරින් උපකාර වූ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ, පී.පී.ගුණවර්ධන, නිශ්ශංක, පීනදාස සිටුගේ, ඡායාරූපකරණය, ඡායාපිටපත්කරණය ආදි කාර්යන්හි ප්‍රමුඛ වූ මහාමාර්ග රාජ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ඩබ්ලිව්.ඒ.කරුණාසේන, සපුගස්කන්දේ රාජ්‍ය පොහොර සංස්ථාවේ ක්‍රියාකාරි අධ්‍යක්ෂ, පී.එගොඩවත්ත,

නිරතුරුව මා දිරිමත් කළ තේ.ගුණසිරි, දයාවංශ ගමලත් සහ සැබෑ මිත්‍රත්වයෙන් සැමවිට ශක්තියක් වූ ගිහි සම්භාවනීයයන් සියළු දෙනා ද, ඇතුළුව ක්‍රියාන්විතව උපකාර කළ සැවොම මෙහි දී පුණ්‍යානුමෝදනා පූර්වකව සිහි කරමි.

## සංක්ෂේපණය

බෞද්ධ සංස්කෘතියේ ඉතිහාසය තුළ මෙන්ම ප්‍රායෝගික පන බුදු සමය තුළ ද විද්‍යමාන වන ආගමික සංකල්පයක් වූ අපාය පිළිබඳ ඉගැන්වීම ඓතිහාසික හා තුළනාත්මක විමර්ශනයකට ලක් කිරීම මෙම නිබන්ධනයෙහි අරමුණ විය.

එහිදී ආදි බෞද්ධ චින්තනය තුළින් මෙම සංකල්පය නිරූපිත ආකාරයත්, ථේරවාදී අටුවා සහ ධර්ම ප්‍රකරණ තුළින් එම සංකල්පය වඩාත් ප්‍රායෝගික ජනකාන්ත සංකල්පයක් බවට පත් කර ඇති ආකාරයත් විමර්ශනය කරනු ලැබිණි. එහි ලා මහායානය, තන්ත්‍රයානය හෝ නිකායාන්තරික ථේරවාදී මත කෙරෙහි අවධානය යොමු නොවුනු අතර, අවශ්‍ය පරිදි ශ්‍රී ලාංකික සංස්කෘතිය කෙරේ සම්බන්ධවන ලෝක ආගම් පිළිබඳව තුළනාත්මක ලෙස පරීක්ෂා කිරීමත් ද සිදු කරන්නට යෙදිණි.

එහෙයින් ඓතිහාසික තුළනාත්මක හා විචාරාත්මක යන ත්‍රිවිධ ශික්ෂාවන් අනුව අප කළ ගවේෂණයෙන් සොයා ගන්නා ලද නිගමනය ථේරීය සම්ප්‍රදායේ ශ්‍රී ලාංකික විභජ්ජවාදී ස්වරූපයට සීමිතය.

අපාය පිළිබඳව මුල් බුදුදහම ඇති විශ්වාසය කෙරෙහි නොදැක්වූ උද්යෝගයක් ථේරවාදී ව්‍යාඛ්‍යාත බුදු සමයෙහි වර්ධනය වූ බව අපට පෙනී ගිය අතර, එය අකුසල කර්මයන්හි විපාක වඩාත් ස්ථූල ලෙස ජනකාන්ත ශෛලියෙන් ඉදිරිපත් කිරීමට ගත් ප්‍රයත්නයක් බව අප නිගමනය කළෙමු. එය යුගයෙහි සමාජ සදාචාර ප්‍රවර්ධනයෙහි විශිෂ්ට සේවයක් කර ඇති බව ද පෙනී යයි.

ඒ අනුව මෙය අධිභෞතික සංකල්පයකට වඩා ආචාර විද්‍යාත්මක සංකල්පයක් ලෙස නිගමනය කරමු. පාලි ත්‍රිපිටකාගත සාධක පරීක්ෂා කරන විට අපට මැනවින් පෙනී ගිය කරුණක් නම් ශ්‍රී ලාංකික බුදු සමයේ දියුණු කරන ලද අපාය සංකල්පයේ නිශ්චිත භෞතික ව්‍යුහය පාලි ග්‍රන්ථ පොත්පත්වල නොවූ බව ය. අපාය භූමි වින්‍යාසය හෝ සංඛ්‍යාව හෝ අපායවල ස්වරූපය ආදිය ගැන සුසංගත චිත්‍ර නිකාය පතපොතින් නිර්මාණය කළ හැකි නොවේ.

ජාතකට්ඨ කථාව රචිත යුගය වන විට අපාය සංඛ්‍යාව 136 ක් බවට පත් කරන ලදී. එමෙන්ම එම 136 හි ආධිපත්‍යය, කාර්යය නිරයවධකයන්, යමපල්ලන්, වධෝපකරණ, වධක විධි යනාදිය මහත් අභිරුචියෙන් නිර්මාණය කරන ලද්දේ එම යුගයේදී ය.

කර්ම විභාගයට, ලෝවැඩ සඟරාවට, පේතවත්ථු වර්ණනාවට, භූමි වූයේ ඒ සංකල්පයයි. එතෙකුදු වුවත්, 136 හි සීමාව තුළ බෞද්ධ ධර්ම සන්නිවේදකයන් රැඳී නොසිටි බවට විවිධ ධර්ම ප්‍රකරණවලදී ඉහත 136 ට නොගැනෙන නාම වලින් වෙනත් අපායයන් පිළිබඳ කරුණු සඳහන් කර තිබීමෙන් පෙනේ. එමෙන්ම ඇතැම් අවස්ථාවල ඒක වචනයෙන් එකම නිරයක් හඟවන අයුරින් " අපාය " යන්න භාවිතා වන බවද අපට පෙනී ගියේය. නාමකරණය පිළිබඳ විමසීමේ දී අපාය, නිරය යැයි වචන නිශ්චිතව ජේවල වචන භාවිතයකට වඩා පුවිසිලි ස්වභාවයකින් යුතුමය ලෙස අවස්ථාවෝචිතව යොදා ගෙන ඇති බවද පෙනී යයි. එහෙයින් ඉතිහාසයේ කිසිම අවස්ථාවකදී අපාය සංකල්පයේ වර්ධනය පරියන්තයකට පත් නොවූ බව අපි නිරීක්ෂණය කරමු.

# හැකුළුම්

අ. – අඞ්ගුත්තර නිකාය

අසංපු. – අභිධර්මාර්ථ සංග්‍රහ පුරාණ සන්නය.

ඉබ්. – එන්සයික්ලෝපීඩියා බ්‍රිටැනිකා.

ඉමො. – ඉමෝෂන්ස් රීත්ස් ඇන්ඩ් තියරීස්.

උප. – උපනිෂද්.

කවි. – කර්ම විභාගය.

කුවි. – අල්-කුර්ආන් අර්ථ විවරණ.

ක්‍රි. – ක්‍රිස්තු ධර්ම විවරණය.

ඛු. – ඛුද්දක නිකාය.

ජා. – ජාතක පාලි.

ජාක. – ජාතකට්ඨ කථා.

ටූ. – ද ටූ හැන්ඩ්ස් ඔෆ් ගෝඩ්.

දී. – දීඝනිකාය.

ධ. – ධර්මපද ප්‍රදීපිකාව.

ධවි. – ධම්මපද විවරණ.

නිස. – නිර්වාණය හා සදාචාරය.

ප. – පපඤ්චසූදනී.

පර. – පරමත්ථජෝතිකා.

පැර. – පැරඩයිස් ලෝස්ට්.

පීඩි. – පාලි ඉංග්ලිෂ් ඩික්ෂනරි.

පේත. – පේතවත්ථු වර්ණනා.

බෘහ. – බෘහදාරණ්‍යක උපනිෂද.

භාද. – භාරතීය දර්ශන.

ම. – මජ්ඣිම නිකාය.

මනු. – මනුස්මෘතිය.

මනෝ. – මනෝරථපූරණී.

| | | |
|---|---|---|
| මිපිනි. | – | ආදිකල්පික මිනිසා පිළිබඳ නිතිය. |
| රෙ. | – | රෙලිජන්ස් ඔෆ් ඉන්ඩියා. |
| ලි. | – | අ හැන්ඩ් බුක් ඔෆ් ලිවින් රෙලිජන්ස්. |
| ලෝ. | – | ලෝවැඩ සඟරාව. |
| වෛ. | – | වෛදික සාහිත්‍යය. |
| ස. | – | සංයුක්ත නිකාය. |
| සස. | – | සත්ත්ව සන්තතිය. |
| සසා. | – | සද්ධර්ම සාගරය. |
| සා. | – | සාරත්ථප්පකාසිනී. |
| සිමි. | – | සිංහල මිලින්ද ප්‍රශ්නය. |
| සු. | – | සුමඞ්ගල විලාසිනී. |
| සුභා. | – | සුභාෂිතය. |
| ශුකු. | – | ශුද්ධ වූ අල්–කුර්ආන්. |
| ශුබ. | – | ශුද්ධ බයිබලය. |

# පටුන


| | පිටු අංකය |
|---|---|
| පළමුවන පරිච්ඡේදය. :: :: :: :: <br> අපාය පිළිබඳ බෞද්ධ මතය හා එහි විකාශය. | 1 - 34 |
| දෙවන පරිච්ඡේදය. :: :: :: :: <br> හින්දු දහමෙහි එන අපාය සංකල්පය හා බෞද්ධ අපාය සංකල්පය පිළිබඳ තුලනය. | 35 - 61 |
| තුන්වන පරිච්ඡේදය. :: :: :: :: <br> අපාය පිළිබඳ ඉස්ලාම් මතය සහ බුදුසමයෙහි එන අපාය සංකල්පයට එය සම විසම වන අයුරු. | 62 - 81 |
| හතරවන පරිච්ඡේදය. :: :: :: :: <br> අපාය සංකල්පය පිළිබඳ ප්‍රාග් බෞද්ධ භාරතීය විශ්වාස හා ඒවායේ විකාශය. | 82 - 113 |
| පස්වන පරිච්ඡේදය. :: :: :: :: <br> අපාය සංකල්පය සහ නූතන විචාර. | 114 - 134 |
| නිගමනය. :: :: :: :: :: | 135 - 148 |
| ග්‍රන්ථාවලිය. :: :: :: :: :: | 149 - 152 |
| ඵලක. :: :: :: :: :: | 153 - 180 |

## ඵලක නාමාවලිය.

ඵලක අංක 1. අවීචි මහා නරකය

,, ,, 2. අඟුරුමැල නරකය

,, ,, 3. ශීත නරකය

,, ,, 4. ඉඹුල්වන නරකය

,, ,, 5. දළතෙස්මැලි නරකය

,, ,, 6. ලෝතුඹු නරකය

,, ,, 7. වෙරළ නරකය

,, ,, 8. තාප නරකය

,, ,, 9. කටු ඉඹුල

,, ,, 10. පොතුරුපත් නරකය

,, ,, 11. සංඝාත නරකය

,, ,, 12. ලෝහාන්තරික නරකය

,, ,, 13. සංජීව නරකය

,, ,, 14. මහා රෞරව නරකය

,, ,, 15. ප්‍රේත ලෝකය

,, ,, 16. ප්‍රේත ලෝකය

,, ,, 17. ප්‍රේත ලෝකය

,, ,, 18. ප්‍රේත ලෝකය

,, ,, 19. අසුර අපාය

,, ,, 20. කටු ඉඹුල්වන නරකය

,, ,, 21. ඔසුපත් නරකය

,, ,, 22. තාප නරකය

,, ,, 23. කාලසූත්‍ර නරකය

,, ,, 24. කටු ඉඹුල්වන නරකය

,, ,, 25. චිඤ්ච මානවිකාව අපායට ඇදගෙනයන ආකාරය

,, ,, 26. අස්පත්වන නරකය

,, ,, 27. ප්‍රේත ලෝකය

,, ,, 28. දේවදත්ත හිමි අපායට ඇදගෙන යාම

# පළමුවන පරිච්ඡේදය

## අපාය පිළිබඳ බෞද්ධ මතය හා එහි විකාශය

### වචනාර්ථ විග්‍රහය.

රිස් ඩේවිඩ්ස් පඬිවරයාගේ සංස්කරණයෙන් පළ කොට ඇති පාලි - ඉංග්‍රීසි ශබ්ද කෝෂයෙහි අපාය යන්නට අර්ථ පසක් දැක්වේ.

1. වෙන්වීම, විප්‍රයෝගය
2. වස්තු හානිය, විනාශය
3. (ජලය වැනි දෙයක්) කාන්දුවීම, බැහැරවීම
4. චරිතයෙන් පිරිහීම, අධ්‍යාත්ම දූෂණය
5. පව්කළ සත්ත්වයන් මරණින් මතු ඉපිද දුක් විඳිනා ස්ථාන හෙවත් අපාය භූමි [1]

---

1. පිරඩි., 54 පිට.

පුස්තකාලය

මේ නිබන්ධනයෙහි ලා විමර්ශනයට ලක්කෙරෙන්නේ මෙහි පස්වැනි අර්ථය වශයෙන් දක්වන ලද අපායභූමියි.

ඒ අනුව " අපාය" ශබ්දය මුලින්ම පහවීම, වෙන්වීම, දුකට භාජනයවීම වැනි අර්ථවල යෙදී තෙමෙන් වර්ධනය වෙමින් "අපාය භූමි" යන අර්ථයෙහි යෙදුණු බව පෙනී යයි. මේ අපාය සංකල්පය බුද්ධකාලීන අවධියෙහි අද පවත්නා තරම් වර්ධනය වී තිබිණිදැයි ඉඳුරා දැක්වීම උගහටය. හේතුව නම් පාලි ත්‍රිපිටක සාහිත්‍යයෙහි දක්නට නොලැබෙන අපාය සංකල්පය පිළිබඳ කරුණු පශ්චාත් සාහිත්‍ය ග්‍රන්ථවල දක්නට ලැබීමය. පාලි සාහිත්‍යයෙහි දක්නට ලැබෙන්නේ මෙහි ආරම්භය පිළිබඳ මූලික කරුණු කීපයක් පමණි. ඒවාද එම සාහිත්‍යයෙහි තැනින් තැන විසිරී පවත්නා අතර, ඒවා සියල්ල එක්රැස්කර ගැනීමෙන් වුවද, නූතනයෙහි පවත්නා තරම්, අපාය සංකල්පය පිළිබඳ අංග සම්පූර්ණ හා පැහැදිලි චිත්‍රයක් මතු කර ගැනීම ද දුෂ්කරය.

පාලි ත්‍රිපිටක සාහිත්‍යයේ මුල් අවධියේ දී "අපාය" ශබ්දය "නිරය" යන්නට විශේෂණයක් ලෙසින් මෙන්ම පර්යාය පදයක් සේ ද යෙදී ඇති බව පෙනේ. මේ නිදසුන්ය.

> " මිච්ඡාදිට්ඨියා හින්දවේ සමන්නාගතා සත්තා
> කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං
> විනිපාතං නිරයං උප්පජ්ජන්ති " [1]

---

1. අ., 64 පිට.

(මහණෙනි, මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්ත වූ සත්ත්වයෝ කාබුන් මරණින් මතු අපාය නම් වූ දුගති නම් වූ විනිපාත නම්වූ නිරයෙහි උපදින්නහුය.)

" අධම්මචරියා විසමචරියා හේතු බෝ බ්‍රාහ්මණ ඒවම්ධෙකච්චේ
සත්තා කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං
විනිපාතං නිරයං උප්පජ්ජන්ති ".[1]

(බ්‍රාහ්මණය, මෙබඳුවූ ඇතැම් සත්ත්ව තෙනෙත් අධර්ම හැසිරීම, විසම හැසිරීම හේතුකොට ගෙන කාබුන් මරණින් මතු අපාය නම් වූ. දුගති නම් වූ, විනිපාත නම් වූ නිරයෙහි උපදිති.)

පාලි සාහිත්‍යයෙහි තිහිප තැනෙකම, "කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජෙය්‍යං ඨාන මේතං විජ්ජති." යන යෙදුම හෝ ඊට සමාන වන යෙදුම් දක්නට ලැබේ. මෙහි අපාය යනුවෙන් දක්වා ඇත්තේ සැපයෙන් පහ වූ ස්ථානය යන අර්ථය ගෙන දීමට ය.

නිරය ද එම අර්ථයෙහිම යෙදේ. එය අපාය භූමි අතර වෙනම අපාය භූමියක් ලෙස සලකන ලද්දේ පසු කාලයෙහි මේ වචනද්වය එකම අර්ථයෙහි ලා සලකන ලද බව ත්‍රිපිටකයේ ඇතැම් සඳහන්වලින් පෙනේ. බුදුන් වහන්සේ වරෙක මෙසේ වදාළ සේක.

---

1. අ., 110 පිට.

" <u>අනේකපරියායේනපි ඛෝ අහං භික්ඛවේ, නිරයකථං කථෙය්‍යං, යාවඤ්චිදං භික්ඛවේ, න සුකරා අක්ඛානේන පාපුණිතුං යාව දුක්ඛා නිරයාති.</u>"[1]

(මහණෙනි; මම නන් අයුරින් නිරය කථා කියමි. මහණෙනි, නිරයයෝ මෙතෙක් දුක් ඇතියහයි කීමෙතින් මස්තක ප්‍රාප්ත කොට කියන්නට සුකර නොවේමැයි")

මේ නයින් සිතා ගත හැක්කේ නිරය පිළිබඳ පවත් බුද්ධ දේශනයට අයත් බව සහ බුදු දහමෙහි එන අපාය සංකල්පයේ ආරම්භය හා විකාශය ත්‍රිපිටක සාහිත්‍යය තෙරෙන්ම ඇති වූවත් බවය. එහි එන කරුණු අනුව අපාය සංකල්පයේ මූලික ස්වරූපය විමසිල්ලට ලක් කළ යුතු වේ.

ඒ අනුව ත්‍රිපිටක සාහිත්‍යයේ දැක්වෙන අපාය සංකල්පයේ මූලික හා ආදිතම අදහස ලෙස දැක්විය හැක්කේ අෂ්ට දුෂ්ටක්ෂණ (අක්ඛණ) සම්බන්ධයෙන් දක්වා ඇති සඳහන්ය.

දීඝ නිකායේ පාථික වග්ගයේ සංගීති සූත්‍රයේ මෙබඳු සඳහනක් වෙයි.

---

1. මු., 366 පිට.

" <u>නව අක්ඛණා අසමයා බ්‍රහ්මචරියවාසාය: ඉධ භික්ඛවෙ, තථාගතෝ ච ලෝකේ උප්පන්නෝ හෝති අරහං සම්මා සම්බුද්ධො, ධම්මෝ ච දේසියති ඕපසමිකෝ පරිනිබ්බානිකෝ සම්බෝධගාමී සුගතප්පවේදිතෝ, අයං ච පුග්ගලෝ නිරයං උප්පන්නෝ හෝති අයං පඨමෝ අක්ඛණෝ අසමයෝ බ්‍රහ්මචරියවාසාය.</u> "[1]

( බ්‍රහ්මචර්ය වාසයට නොසුදුසු වූ කාල වූ අක්ෂණ නවයෙක, ඇවැත්නි; මෙහි අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ ලොවැ පහළ වූ සේක් වෙති. කෙලෙස් සංසිඳුවන, කෙළෙස් පිරිනිවන ගෙනැ දෙන මාර්ග ඥාන ප්‍රතිවේධයට යන, සුගතයන් විසින් ප්‍රකාශිත ධර්මය ද දෙසනු ලැබෙයි. එහෙත් මේ පුද්ගල තෙමේ නිරයට වන්නේ වෙයි. මේ බ්‍රහ්මචර්ය වාසයට නොසුදුසු කාලය වූ පළමු වැනි අක්ෂණය යැ.)

මෙහිම සඳහන් වන පරිදි තිරිසන් යෝනියට පැමිණීම දෙවන අක්ෂණයයි. ප්‍රේත ලෝකයට පැමිණීම තෙවන අක්ෂණයයි. අසුර නිකායට පැමිණීම සිව්වන අක්ෂණයයි. දීර්ඝායුෂ්ක දේව නිකායට පැමිණීම, මලේච්ඡ ජනපදයන්හි ඉපදීම, මිසදිටු බව, මධ්‍ය දේශයෙහි උපන ද නුවණින් පිරිහීම, හා අබුද්ධෝත්පාද කාලය යනු සෙසු අක්ෂණ පස්වයයි.

පශ්චාත් බෞද්ධ අවධියේදී අපායභූමි චතුර්මය වශයෙන් සංවර්ධනය වූ භූමි චතුර්ථය මේ අක්ෂණවල මුල් අංග චතුර්ථය ම වේ.

---

1. <u>දී</u>., 452 පිට.

එහෙත් මේවා පිළිබඳ ගැඹුරු විස්තර ත්‍රිපිටක සාහිත්‍යයට ඇතුළත් කොට නැති බව පෙනේ.

කෙසේ වුවද, සත්ත්වයාගේ මෙලොව ජීවිතයත්, පරලොව ජීවිතයත් සම්බන්ධ කරන, පෘථග්ජන පුද්ගලයාට ඉන්ද්‍රිය ගෝචර අනුභූතියක් නොවන අපාය සංකල්පය පිළිබඳ දැඩි අවධානයක් බුද්ධකාලීන සමාජයේ සිටම යම් ප්‍රමාණයකින් පැවත ආ බව ත්‍රිපිටක සාහිත්‍යය ප්‍රකට කරයි.

අපාය සංකල්පය සංසාරය හා බැඳී පවත්නා සත්ත්ව පැවැත්ම පිළිබඳ ක්‍රියාදාමයේ එක් අංගයක් පමණි යන අදහස මේ අවධියේ ප්‍රචලිතව පැවතිණ. මේ අනුව අපාය සංකල්පය සත්ත්ව ජීවිතයෙන් අන්‍යවූවක් හෝ බැහැර වූවක් හෝ නොවේ.

පරමාර්ථ වශයෙන් සත්ත්වයකු පුද්ගලයකු නැති නමුත් ගඟක් මෙන් ගලා බස්නා ඔවුනොවුනට අයත් සන්තතියක් ඇත. මෙසේ වැල නොකැඩී කෙණෙහි කෙණෙහි බිඳි බිඳී පවත්නා වූ පස් වැදෑරුම් නාම රූප ස්කන්ධයන්ගේ හෝ අටළොස් වැදෑරුම් නාමරූප ධාතූන්ගේ හෝ දොළොස් වැදෑරුම් නාමරූප ආයතනයන්ගේ හෝ පිළිවෙල සංසාර යැයි කියනු ලැබේ. මේ සංසාර ගමන කෙළවර වන්නේ නිවනින් බව බුදු දහම පෙන්වා දෙයි. එහෙත් සංසාරයෙහි සැරිසරන සත්ත්වයා කර්මානුරූපව මෙලොව, පරලොව දුක හෝ සැප හෝ

---